සියලු ම හිමිකම් ඇවිරිණි.

WWW.OLEVELAPI.COM

රහස්‍ය ලේඛනයකි.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020

# 16 - ඉස්ලාම්

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 16 - ඉස්ලාම්

## අවසාන ලකුණු ගණනය කිරීම

### I ප්‍රශ්න පත්‍රය

බහුවරණ 1 - 40 = 1 x 40 40 = 40

### II ප්‍රශ්න පත්‍රය

1 ප්‍රශ්නය (අනිවාර්ය)

1 - 10 දක්වා = 2 x 10 20 = 20

2 ප්‍රශ්නය ( 2 - 6 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

i කොටස ලකුණු 2

ii කොටස ලකුණු 3

iii කොටස ලකුණු 5 10

7 ප්‍රශ්නය - කෙටි සටහන් දෙකක් සඳහා

5 + 5 10

04 x 10 = 40

එකතුව 100

WWW.OLEVELAPI.COM

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................
............................................................
............................................................ √ △ 4/5

(ii) ............................................................
............................................................
............................................................ √ △ 3/5

(iii) ............................................................
............................................................
............................................................ √ △ 3/5

(03) එකතුව → □ 10/15

**බහුවරණ උත්තරපත්‍ර :**

WWW.OLEVELAPI.COM

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.
II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.
III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**
IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.
V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**
VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

W W W . O L E V E L A P I . C O M

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020**
**General Certificate of Education (Ord. Level) Examination, 2020**

**ඉස්ලාම් I, II**
**இஸ்லாம் I, II**
**Islam I, II**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## ඉස්ලාම් I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ඉස්ලාම්හි විශ්වාසය පැහැදිලි කරන කලාව හඳුන්වන්නේ කෙසේ ද?
(1) ඉල්මුල් අකීදා (2) ඉල්මුත් තසව්වුෆ් (3) උසූලුල් හදීස් (4) උසූලුල් ෆික්හ්

**2.** "ඔබගේ පරම්පරාවට උපවාස ශීලය අනිවාර්යය කළාක් මෙන් ඔබට ද උපවාස ශීලය අනිවාර්ය කර ඇත." යන්න
(1) හදීසයකි. (2) උමර් (රලි) තුමාගේ ප්‍රකාශයකි.
(3) ඉබ්නු මස්ඌද් (රලි) තුමාගේ ප්‍රකාශයකි. (4) අල් කුර්ආන් වාක්‍යයකි.

**3.** වරදක් සිදුවේ යන බියෙන් වරදක් ලෙස සැක කරන කිසිවකින් වැළකී සිටීම යන්නට භාවිත කරන පදය කුමක් ද?
(1) ඉක්ලාස් (2) වරඋ (3) තව්බා (4) කව්ෆ්

**4.** නබි මූසා (අලෛ) තුමාට විරුද්ධව සිට නයිල් නදිය තරණය කිරීමේ දී ගිලුණු රජු කවු ද?
(1) හාමාන් (2) කාරූන් (3) නුම්රූද් (4) ෆිර්අවුන්

**5.** 'කරුණාවන්තයා' යන අර්ථය දෙන අල්ලාගේ ශුද්ධ වූ නාමය කුමක් ද?
(1) අර්-රහීම් (2) අර්-රහ්මාන් (3) අල්-කාලික් (4) අර්-රාසික්

**6.** පහත සඳහන් දෑ අතුරෙන්, සලාතය මගින් මිනිසා ලබාගන්නා ප්‍රයෝජනවලින් එකක් ලෙස අල්-කුර්ආනයෙහි සඳහන් වන්නේ කුමක් ද?
(1) සලාතය ශාරීරික අභ්‍යාසයකි. (2) සලාතය සමානාත්මතාවය උගන්වයි.
(3) සලාතය නරක ක්‍රියාවලින් වළක්වයි. (4) සලාතය එකමුතුකම ඇති කරයි.

**7.** කෙනෙකු යහ ක්‍රියාවක් 'අල්ලාහ් වෙනුවෙන්' යන පවිත්‍ර චේතනාවෙන් කරන අතර ජනයා තමාව ප්‍රශංසා කළ යුතු යැයි අපේක්ෂා කරයි. එම ක්‍රියාව
(1) අල්ලාහ්ට ආදේශ තැබීමකි. (2) යහ ක්‍රියාවකි.
(3) පිළිගත හැකිය. (4) අනුමැතිය ඇති ක්‍රියාවකි.

**8.** ප්‍රථම වහී ලැබුණු විට ඇති වූ කම්පනයෙන්, හිරා ගුහාවේ සිට නිවසට පැමිණි නබි (සල්) තුමා එම සිදුවීම ප්‍රථමයෙන් පැවසුවේ කාහට ද?
(1) අබූබක්ර් (රලි) (2) කදීජා (රලි) (3) ආයිෂා (රලි) (4) සව්දා (රලි)

**9.** මස්ජිද් ගොඩනැගිලිවල ඇති අංගවලට සම්බන්ධ නොවූ වචනය කුමක් ද?
(1) මිහ්රාබ් (2) මිම්බර් (3) මිනාරා (4) මක්බරා

**10.** ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවන්ගේ අධ්‍යාපන අභිවෘද්ධිය වෙනුවෙන් පළමුව අධ්‍යාපන ආයතන ගොඩනැංවූ තැනැත්තා කවුරුන් ද?
(1) ටී.බී. ජායා (2) වාප්පිච්චි මරික්කාර් (3) එම්.සී. සිද්දි ලෙබ්බෙ (4) බදියුද්දීන් මහ්මුද්

**11.** පහත වචන සලකන්න.

A - තලාක් B - ඊජාබ් C - මහර් D - කබූල්
E - ලිආන් F - ලිහාර් G - කුල්උ H - නෆකා

ඉහත වචනවලින් දික්කසාදයට සම්බන්ධ වූ වචන අයත් වන වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, E, F, G (3) B, C, D, E (4) B, F, G, H

**12.** නබි (සල්) තුමා කෙරෙහි තිබූ විශ්වසනීයත්වය හේතුවෙන් කුරෛෂිවරු ඔහුට පිළිගැන්වූ විශේෂිත නාමය කුමක් ද?
(1) අල්-අමීන් (2) අස්-සිද්දීක්
(3) අල්-ෆාරූක් (4) අර්-රසූල්

**13.** හජ් චාරිත්‍ර ඉටුකරන ක්‍රමවේද අතර 'අල් කිරාන්' ලෙස හැඳින්වෙන්නේ කුමක් ද?
(1) හජ් සහ උම්රා එක්කොට ඉටුකිරීම (2) හජ් පමණක් ඉටුකිරීම
(3) උම්රා පමණක් ඉටුකිරීම (4) හජ්වලට යෑමට අධිෂ්ඨාන කිරීම

**14.** මිනිසාගේ සිත්වලින් 'තමන්ගේම සිත රිද්දවා ගන්නා සිත' යන්න
(1) නෆ්සුල් මුත්මඉන්නා වේ. (2) නෆ්සුල් අම්මාරා වේ.
(3) නෆ්සුල් මර්ලියියා වේ. (4) නෆ්සුල් ලව්වාමා වේ.

**15.** පහත වගුවෙහි ඇතැම් නබිවරුන්ගේ නම් සහ ඔවුන්ට වහී පහළ කළ ක්‍රම ද දී ඇත.

| | නබි වරුන්ගේ නම් | වහී පහළ කළ ක්‍රම |
|---|---|---|
| (1) | ඉබ්රාහීම් (අලෛ) | A - අදෘෂ්‍යමාන මූලයකින් ලද හඬ |
| (2) | මූසා (අලෛ) | B - සංඥා |
| (3) | සකරියියා (අලෛ) | C - සිහින |

ඉහත දැක්වෙන නබිවරුන්ගේ නම් ඉදිරියේ වහී පහළ කළ ක්‍රමය අනුපිළිවෙළට ගළපා ඇති වරණය කුමක් ද?
(1) ABC (2) ACB (3) CAB (4) CBA

**16.** පහත දැක්වෙන වචන යුගලවලින් ප්‍රතිවිරුද්ධ අදහස් දෙන වචන යුගල මොනවා ද?
(1) අල්-ලාත්, අල්-මනාත් (2) යව්මුල් හෂ්ර්, යව්මුල් බඃස්
(3) මජන්නා, දුල්-මජාස් (4) අල්-ජන්නා, අන්-නාර්

**17.** කලීෆා අබුබක්ර් (රළි) තුමා ඉටු කළ සේවාව කුමක් ද?
(1) හිජ්රි වර්ෂය හඳුන්වා දීම (2) අල්-කුර්ආනය ග්‍රන්ථකරණය කිරීම
(3) රාජ්‍ය දෙපාර්තමේන්තු ඇති කිරීම (4) ඊජිප්තුව ජය ගැනීම

**18.** කෙනෙකුගේ මූලධනයත් තවකෙනෙකුගේ ශ්‍රමයත් එකතුකර සිදුකරන ව්‍යාපාරය ඉස්ලාමීය දී හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) මුලාරබා (2) මුසාරආ (3) මුෂාරකා (4) මුරාබහා

**19.** නබි (සල්) තුමාගේ සමයේ යෙමන් දේශයේ ආණ්ඩුකාරවරයා ලෙස යැවූ සහාබි කවු ද?
(1) අබ්දුල්ලාහ් ඉබ්නු රවාහා (රළි) (2) මුආද් ඉබ්නු ජබල් (රළි)
(3) සඃදු ඉබ්නු මුආද් (රළි) (4) මුආවියා ඉබ්නු අබූ සුෆ්යාන් (රළි)

**20.** අන්වර් ක්‍රීඩාපිටියේ සිට පැමිණෙන අතර මස්ජිදයට ගොස් ජමාත් සලාතයේ දෙවන රක්ආතයේ සම්බන්ධ වී සෑම රක්අත් හි ම අත්තහියියාත්හි සිටියේය. ඔහු ඉටුකළ සලාතය කුමක් ද?
(1) ලුහර් (2) අසර් (3) මඃරිබ් (4) ඉෂා

**21.** කෙනෙකුට ස්නානය අනිවාර්ය වන අවස්ථාව කුමක් ද?
(1) ජනාසා ස්නානයක් සිදු කළ පසු
(2) උෂ්ණත්වය අධිකව පැවති අවස්ථාවේ
(3) මහා කිල්ලක් සිදුවූ අවස්ථාවෙන් පසු
(4) ගමන් ගොස් නිවසට පැමිණි පසු

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....



22. 'රබ්බුන් නාස්' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) මිනිසාගේ පරමාධිපති (2) ලෝකයටම දයාන්විතයා
(3) විශ්වයේ දෙවියා (4) පරමාන්ත දිනයෙහි අධිපති

23. පහත ප්‍රකාශවලින් 'ෆස්කු' පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ස්වාමි පුරුෂයා විසින් සිදුකරවන්නකි.
(2) භාර්යාව මවට සමාන කිරීමයි.
(3) ස්වාමි පුරුෂයාට යම් ආධාරයක් දී භාර්යාව වෙන්වීමයි.
(4) ස්වාමි පුරුෂයා සහ භාර්යාව මහ්රම්වරුන් යැයි දැන ගැනීමයි.

24. පහත වගුවේ '**අ**' තීරුවේ වචන '**ආ**' තීරුවේ ඒවාට අදාළ විස්තර දක්වා ඇත.

| | අ | ආ |
|---|---|---|
| (1) | ෂාහිද් | A - විවාහය |
| (2) | නිකාහ් | B - විවාහ ගිවිසුමේ සාක්ෂිකරු |
| (3) | වලි | C - මනාලයා දෙන භෝජන උත්සවය |
| (4) | වලීමා | D - මනාලියව මනාලයාට භාරදීමට අයිතිය ඇති තැනැත්තා |

ඉහත '**අ**' තීරුවේ අදාළව '**ආ**' තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.
(1) A B C D (2) B A D C (3) C D B A (4) D B A C

25. නබි (සල්) තුමා තම අවසාන රමලානයේදී ජිබ්රීල් (අලෛ) තුමාට අල්-කුර්ආනය සම්පූර්ණයෙන්ම පාරායනය කර දැක් වූ විට ඔහු සමග සිටි සහාබි කවු ද?
(1) උමර් (රළි) (2) උස්මාන් (රළි) (3) ඉබ්නු අබ්බාස් (රළි) (4) සයිද් ඉබ්නු සාබිත් (රළි)

26. අල්ලාහ්ගේ අදහස හා නබි (සල්) තුමාගේ වචන භාවිතය යනුවෙන් හැඳින්වෙන්නේ
(1) හදීසුල් කුද්සි වේ. (2) හදීස් නබවි වේ. (3) අල්-හබර් වේ. (4) අල්-අසර් වේ.

27. පහත මූලාශ්‍රවලින් අක්ෂර ලෙසත් ශබ්ද ලෙසත් ආරක්ෂා කරගෙන පැමිණි මූලාශ්‍රය කුමක් ද?
(1) අස්-සුන්නා (2) අල්-කුර්ආන් (3) අල්-ඉජ්මා (4) අල්-කියාස්

28. නබි (සල්) තුමා හිජ්රත් වන්දනාවේ යන අතරමගදී නවාතැන් ගත් ස්ථානය කුමක් ද?
(1) තෞර් ගුහාව (2) ජබලුර් රහ්මා (3) හිරා ගුහාව (4) ජබලුන් නූර්

29. නබි (සල්) තුමාගේ හදීස් ග්‍රන්ථකරණ උත්සාහය මුලින්ම ආරම්භ කරන ලද්දේ කුමන පාලන සමයේ ද?
(1) කුලෆාඋර්රාෂිදූන් සමයේ දී ය. (2) උමයියා සමයේ දී ය.
(3) අබ්බාසින්ගේ සමයේ දී ය. (4) උතුමාන්වරුන්ගේ සමයේ දී ය.

30. මුජ්තහිද්වරයෙකු සතුවිය යුතු හැකියාවන් පිළිබඳ වැරදි ප්‍රකාශය කුමක් ද?
(1) අල්-කුර්ආන් සහ අස්-සුන්නා පිළිබඳ ගැඹුරු දැනුම
(2) අරාබි භාෂාවේ පාණ්ඩිත්‍යය
(3) මධ්‍යතන යුගයේ මුස්ලිම්වරුන් අතර වර්ධනය වී තිබූ කලාවන් පිළිබඳ දැනුම
(4) පෙර සිටි මුජ්තහිද්වරුන්ගේ ඉජ්තිහාද් පිළිබඳ විස්තරය

31. පහත දෑ අතුරෙන් සලාතයේ දී අනිවාර්යයෙන් පාරායනය කළ යුත්තේ
(1) දුආඋල් ඉස්තිෆ්තාහ් වේ. (2) ආයතුල් කුර්සි වේ.
(3) සූරතුල් ෆාතිහා වේ. (4) සූරතුල් ඉක්ලාස් වේ.

32. 'තර්තීබුන් නුසුල්' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
(1) අල්-කුර්ආන් සම්පාදනය කර ඇති පිළිවෙළ
(2) අල්-කුර්ආන් පහළ කළ පිළිවෙළ
(3) අල්-කුර්ආන් පාරායනය පිළිවෙළ
(4) අල්-කුර්ආන් හි වචන පහළ කිරීමට හේතු

**33.** කුලෆාඋර්රාෂිදූන් සමයේ ෂාම් දේශයේ ආණ්ඩුකාර ලෙස ක්‍රියා කළ මුආවියා (රළි) තුමාගේ නායකත්වය යටතේ නාවික හමුදාවක් ස්ථාපිත කළ කලීෆා කවරහු ද?
(1) අබූබක්ර් (රළි) (2) උමර් (රළි) (3) උස්මාන් (රළි) (4) අලි (රළි)

**34.** පහත වගුවෙහි ඇතැම් ඉමාම්වරුන්ගේ නම් සහ ඔවුන්ගේ අන්වර්ථ නාමයන් දක්වා ඇත.

| | ඉමාම් වරුන්ගේ නම් | අන්වර්ථ නාමයන් |
|---|---|---|
| (1) | ඉමාම් අබූ හනීෆා (රහ්) | A - ආලිමුල් කුරෛෂ් |
| (2) | ඉමාම් මාලික් (රහ්) | B - ඉමාමුල් අඃලම් |
| (3) | ඉමාම් ෂාෆිඊ (රහ්) | C - ඉමාමුල් මදීනා |

ඉහත ඉමාම්වරුන්ගේ නම් ඉදිරියේ අන්වර්ථ නාමය අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන නිවැරදි වරණය කුමක් ද?
(1) ABC (2) ACB (3) BAC (4) BCA

**35.** කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමට ඇඳිරි නීතිය ප්‍රකාශ තිබූ අවස්ථාවේ අඛණ්ඩව පංචකාල සලාතය සාමූහිකව ඉටුකිරීමේ පුරුද්ද පැවැති ඇතැම් අය මස්ජිදයට ගොස් හක්තිමත්ව සලාතය ඉටු කළහ. මෙම ක්‍රියාව කෙසේ සැලකිය හැකිද?
(1) මෙය 27 ගුණයක් කුසල් දෙන ක්‍රියාවකි.
(2) මෙය ෆර්ලු කිෆායා වේ.
(3) මෙය නීතිය කඩකරන වැරදි ක්‍රියාවකි.
(4) වසංගත රෝගය යන්න ආගමෙහි නැති දෙයකි.

**36.** පුද්ගලයෙකු තම භාවිතය සඳහා මෝටර් රථයක් ඉස්ලාමික බැංකුවකින් අවුරුදු පහක කුලී පදනමක් මත ලබා ගන්නා ලදී. මෙම ගිවිසුම හඳුන්වන පදය කුමක් ද?
(1) සලම් (2) ඉජාරා (3) රහ්න් (4) වකාලා

**37.** 'බාබුර් රයියාන්' යන ප්‍රවේශ දොරින් ස්වර්ගයට පිවිසෙනු ඇතැයි හදීස්හි සඳහන් කර ඇති අය කවුරුන් ද?
(1) රමලාන් හි අඛණ්ඩව උපවාස කරන අය
(2) දවසකට පස්වතාවක් අඛණ්ඩව සලාතය ඉටුකරන අය
(3) පිළිවෙළින් zසකාත් දුන් අය
(4) හජ් ඉටුකළ අය

**38.** පහත ප්‍රකාශ අතුරෙන් zසකාත් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ව්‍යාපාරික භාණ්ඩවලට zසකාත් ඉටුකිරීමට 'නිසාබ්' අවශ්‍ය නැත.
(2) රමලාන් මාසයේ zසකාත් දීම අනිවාර්ය වේ.
(3) මුඅල්ලෆතුල් කුලූබ් යන කණ්ඩායම zසකාත් ලැබීමට සුදුස්සන් වෙති.
(4) දිනපතා තම වියදමට සරිලන ආදායමක් ලබාගන්නාට zසකාත් නියම වේ.

**39.** පහත ප්‍රකාශයන් සලකන්න.
A - සියලු වන්දනා අතුරෙන් ප්‍රධාන වන්දනය වන්නේ සලාතයයි.
B - මුස්ලිම් පිරිමින් ඇතැම් අවස්ථාවල සලාතය ඉටු නොකිරීමට අවසර දී ඇත.
C - මිඃරාජ්හිදී නබි (සල්) තුමාට සලාතය ත්‍යාගයක් ලෙස දෙන ලදී.
D - ජිබ්රීල් (අලෛ) තුමා සලාතයේ පිළිවෙළ නබි (සල්) තුමාට ඉගැන්වීය.
ඉහත ප්‍රකාශවලින් සලාතය පිළිබඳ නිවැරදි ප්‍රකාශයන් මොනවා ද?
(1) A හා B (2) B හා C (3) A, B හා C වේ (4) A, C හා D වේ

**40.** මුස්ලිම්වරුන්ගේ මුතුන් මිත්තන් වූ අරාබිවරු ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ප්‍රදේශයේ ජනාවාස පිහිටුවීමට තුඩුදුන් හේතුවක් ලෙස සැලකිය **නොහැකි** ප්‍රකාශය කුමක් ද?
(1) ශ්‍රී ලංකාව, නැගෙනහිර සහ බටහිර සම්බන්ධ කරන වෙළඳ මාර්ගයේ පිහිටීම
(2) ශ්‍රී ලංකාව අරාබි අර්ධද්වීපයට ඉතා ආසන්නයේ පිහිටීම
(3) විදේශීය වෙළෙන්දන්ගේ නවාතැන්පොළක් ලෙස ශ්‍රී ලංකාව පිහිටීම
(4) ශ්‍රී ලංකාවේ වරායන්හි ආහාර හා පානීය ජල පහසුකම් තිබීම

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2020

විෂය අංකය / பாட இலக்கம்: **16**

විෂයය / பாடம்: **ඉස්ලාම්**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 01 | 11. | 02 | 21. | 03 | 31. | 03 |
| 02. | 04 | 12. | 01 | 22. | 01 | 32. | 02 |
| 03. | 02 | 13. | 01 | 23. | 04 | 33. | 03 |
| 04. | 04 | 14. | 04 | 24. | 02 | 34. | 04 |
| 05. | 01, 02 | 15. | 03 | 25. | 04 | 35. | 03 |
| 06. | 03 | 16. | 04 | 26. | 01 | 36. | 02 |
| 07. | 01 | 17. | 02 | 27. | 02 | 37. | 01 |
| 08. | 02 | 18. | 01 | 28. | 01 | 38. | 03 |
| 09. | 04 | 19. | 02 | 29. | 02 | 39. | 04 |
| 10. | 03 | 20. | 03 | 30. | 03 | 40. | 02 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25/40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25/40



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

| | |
|---|---|
| ඉස්ලාම් | I, II |
| இஸ்லாம் | I, II |
| Islam | I, II |

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) ඉස්ලාම් අකීදාවට පදනම් වන මූලාශ්‍රයන් **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඉන්ජීල්, සබූර් යන වේදයන් දායාද ලද නබිවරුන් දෙදෙනාගේ නම් සඳහන් කරන්න.

(iii) ඉස්ලාම් නීති විශාරදයින් විසින් වර්ගීකරණය කරන ලද ජලයේ ප්‍රධාන වර්ග **දෙකක්** සඳහන් කර, ඒවාට වෙන වෙන ම නිදසුන් සපයන්න.

(iv) ඉජ්මාහි වර්ග **දෙකක්** ඒවායේ අර්ථයන් සමග සඳහන් කරන්න.

(v) zසකාත් ලැබීමට සුදුසු අය අතුරෙන් ෆකීර් සහ මිස්කීන් යන අය වෙන් කර දක්වන්න.

(vi) 'සීරා' යන පදය මගින් අවබෝධ කරගන්නේ කුමක් ද?

(vii) 'අකීකා' සහ 'උළ්හියා' යන්න අර්ථ දක්වන්න.

(viii) "එක් කද්රයක සිට තවත් කද්රයක් දෙසට ගමන් කරමි" යනුවෙන් සඳහන් කළ සහාබි කවු ද?

(ix) මස්ජිදුන් නබවිහි විශේෂාංග **දෙකක්** සඳහන් කරන්න.

(x) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ ඉස්ලාමික විනිශ්චය සඳහන් ග්‍රන්ථයේ නම සඳහන් කරන්න.

**2.** (i) 'මුඃජිසාතුල් කුර්ආන්' යනු කුමක් ද?

(ii) අල්-කුර්ආන් ප්‍රධාන මුස්ලිම් නීති මූලාශ්‍රයක් යන්න තහවුරු කිරීමට හේතු **තුනක්** සඳහන් කරන්න.

(iii) අල්-කුර්ආන් ආරක්ෂා කිරීමට කලීෆා උස්මාන් (රළි) තුමාගේ දායකත්ව **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**3.** (i) 'ඉබාදත්' යන්න අර්ථ දක්වන්න.

(ii) සලාතය අත්හරින්නාට නබි (සල්) තුමාගේ අවවාදාත්මකව කළ ප්‍රකාශ **තුනක්** සඳහන් කරන්න.

(iii) ෆර්ලු වූ උපවාසයට ඉස්ලාම් ලබාදී ඇති වැදගත්කම් **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**4.** (i) සුහ්ද් සහ රහ්බානියා අතර වෙනස්කම් සඳහන් කරන්න.

(ii) තව්බා පිළිගැනීමට අවශ්‍ය කොන්දේසි **තුනක්** සඳහන් කරන්න.

(iii) ඉස්ලාම් උගන්වන යහපත් ගුණාංග **පහක්** සඳහන් කර ඒවා එකිනෙකට නබි (සල්) තුමාගේ ජීවිතයෙන් නිදසුන් දෙන්න.

**5.** (i) ඉස්ලාමීය මූලධර්ම ආරක්ෂා කර ගනිමින් ව්‍යාපාරයක යෙදීමේ දී මිලදී ගන්නන් සහ විකුණන්නන් ලබන පොදු වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඉස්ලාම් ආර්ථික ක්‍රමයේ විශේෂ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) ඉතිහාසයේ නබිවරුන් ලබා තිබූ රැකියා කුසලතාවන් **පහක්** පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

6. (i) ඉස්ලාම් දෘෂ්ටිකෝණයට අනුව විවාහයේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

(ii) තාරුණ්‍යය ඵලදායි ලෙස වෙනස් කිරීමට ඉස්ලාම් සඳහන් කරන මගපෙන්වීම් **තුනක්** සඳහන් කරන්න.

(iii) ජීවිතයේ මධ්‍යස්ථභාවය (වසතියියා) සුරැකීම පිළිබඳ ඉස්ලාම් ඉදිරිපත් කර ඇති ක්‍රමවේද **පහක්** පැහැදිලි කරන්න.

7. පහත මාතෘකාවලින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පූර්වාදර්ශ වූ ඉස්ලාම් පවුලක ලක්ෂණ

(ii) කලීෆා ලෙස උමර් (රළි) තුමාගේ සේවාවන්

(iii) ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දුන් ඉතිහාසය

(iv) නබි (සල්) තුමා මක්කා සමයේ ඉස්ලාම් දහමට ආරාධනා කරමින් ඉටුකළ සේවාව

* * *

16 - ඉස්ලාම් ii කොටස මගින් ආවරණය වන ඉගෙනුම් ඵල

1 කෙටි පිළිතුරු සැපයීම.

| | | |
|---|---|---|
| i. | 1.1 | අකීදාවේ අන්තර්ගතය විස්තර කරයි. |
| ii. | 1.3 | රිසාලත් හා හිදායත් යන වචන වල තේරුම පහදයි. |
| iii. | 2.1 | ජල වගර් හා නජීස් ඉවත් කරන ආකාරය පැහැදිලි කරයි. |
| iv. | 4.4 | නවීන ප්‍රශ්න වලට විසඳුම් සෙවීම සඳහා ඉජ්මා සහ කියාස් අවශ්‍ය බව දැනුවත්ව පවසයි. |
| v. | 2.2 | zසකාත් ලැබීමට සුදුස්සන්ව දැන පවසයි. |
| vi. | 5.4 | සීරාව විවිධ දෘෂ්ටි කෝණ වලින් ගෙන හැර දක්වයි. |
| vii. | 2.4 | හජ් හා උම්රා වතාවත් වල සුවිශේෂී බව දැන පවසයි. |
| viii. | 1.5 | කද්රයට අනුව සිදුවන විශ්ව නියමයන් අතර තම ජීවිතය සකසා ගැනීම සඳහා තම ක්‍රියා නිදහස භාවිතා කරයි. |
| ix. | 2.5 | මස්ජිද් සහ මුස්ලිම්වරුන්ගේ පූජනීය ස්ථාන දැන පවසයි. |
| x. | 4.4 | ෆික්හු කලාවේ ඉමාම් වරුන්ගේ සේවාවන් ගෙන හැර දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 2 | (i) | 4.1 | අල් කුර්ආනය ප්‍රාතිහාර්යයක් බව විවිධ කෝණ මගින් තහවුරු කර පෙන්වයි. |
| | (ii) | 4.1 | නීති මූලාශ්‍රයක් ලෙස අල් කුර්ආනයේ භූමිකාව පැහැදිලි කරයි. |
| | (iii) | 5.3 | උස්මාන් (රලි) තුමා සමාජයට හා රාජ්‍ය පාලනයට කළ දායකත්වය විස්තර කරයි |
| 3 | (i) | 2.2 | ඉබාදත් යන්නෙහි තේරුම හා එහි ප්‍රායෝගිකත්වය පැහැදිලි කරයි |
| | (ii) | 2.3 | සලාතය ඉස්ලාම් හි මූලික යුතුකම් අතරින් ප්‍රමුඛස්ථානයක් හිමි කර ගන්නා බව සාධක සහිතව ඉදිරිපත් කරයි. |
| | (iii) | 2.3 | සවුම් හි අරමුණු හා වැදගත්කම දැන ක්‍රියාවට නංවයි. |
| 4 | (i) | 3.3 | ආධ්‍යාත්මිකභාවය ප්‍රගුණ කිරීමේ කරුණු අනුගමනය කරයි. |
| | (ii) | 3.3 | ආධ්‍යාත්මිකභාවය ප්‍රගුණ කිරීමේ කරුණු අනුගමනය කරයි |
| | (iii) | 3.1 | යහ ගුණ පිළිපැදීමේ වැදගත්කම විස්තර කරයි. |
| 5 | (i) | 6.1 | ඉස්ලාමීය ආර්ථිකයේ සීමාවන් දැන ඉදිරිපත් කරයි. |
| | (ii) | 6.1.1 | ඉස්ලාමීය ආර්ථිකයට දක්වන දායකත්වය පැහැදිලි කරයි. |
| | (iii) | 6.1.4 | නබිවරු ගොවිතැන් හා අත්කම් කටයුතු වල නිරත වූ බව විස්තර කරයි. |

6 (i) 6.2 විවාහයේ වැදගත්කම හා එහි සුවිශේෂීබව සාධක සහිතව විස්තර කරයි.
Gr:11 නිකාහ් සඳහා වූ නීතිරීති දැන ලියයි.

(ii) 7.1 තරුණ වියේ දී ඉටු කළ යුතු සේවාවන් ඒ අනුව කටයුතු කරයි.

Gr:10

(iii) 7.3 ඉස්ලාම් හි මධ්‍යස්ථභාවය සුරැකීම පිළිබඳ ඉගැන්වීම් පිළිගනිමින් ඉදිරිපත් කරයි.

Gr:10

7 (i) 6.4 පවුල් ජීවිතය සඳහා වන ඉස්ලාමීය අරමුණු දැන ක්‍රියාත්මක කරයි.

Gr:11

(ii) 5.2 උමර් (රලි) තුමා කලීෆා ලෙස තෝරා පත් කළ ආකාරය සහ ඔහු කිලාෆතයට කළ සේවාව ඉදිරිපත් කරයි.

Gr:11

(iii) 5.5 ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දුන් පසුබිම සාධක සහිතව ඉදිරිපත් කරයි.

Gr:11

(iv) 5.3 නබි (සල්) තුමාගේ දඃවා ක්‍රමය පැහැදිලි කරයි.

Gr;10

1. කෙටි පිළිතුරු සපයන්න.

(i) ඉස්ලාම් අකීදාවට පදනම් වන මූලාශ්‍රයන් **දෙකක්** සඳහන් කරන්න.

අල්කුර්ආනය, අස්සුන්නාව (අල්හදීස්) **(ලකුණු 2යි.)**

(ii) ඉන්ජීල්, සබූර් යන වේදයන් දායාද ලද නබිවරුන් දෙදෙනාගේ නම් සඳහන් කරන්න.

- ඉන්ජීල් - නබි ඊසා (අලෛ) තුමා
- සබූර් - නබි දාවූද් (අලෛ) තුමා **(ලකුණු 2යි.)**

(iii) ඉස්ලාම් නීති විශාරදයින් විසින් වර්ගීකරණය කරන ලද ජලයේ ප්‍රධාන වර්ග **දෙකක්** සඳහන් කර, ඒවාට වෙන වෙන ම නිදසුන් සපයන්න.

- අල්මාඋත් තහූර් (ඉතා පිරිසිදු ජලය)

  නිදසුන් ඃ- මුහුදු ජලය, ගංගා ජලය, පයිප්ප වතුර යනාදිය

- අල්මාඋත් තාහිර් (පිරිසිදු ජලය)

  නිදසුන් ඃ- තේ, රෝස වතුර, සිසිල් බීම යනාදිය

- අල්මාඋන් මුතනජ්ජිස් (අපිරිසිදු ජලය)

  නිදසුන් ඃ- කානු වතුර සහ මත්පැන්, මුත්‍රා යනාදිය

**(වර්ග දෙක සඳහා එක ලකුණක් ද, නිදසුන් දෙක සඳහා එක ලකුණක් ද වන ලෙස ලකුණු 2යි.)**

(iv) ඉජ්මාහි වර්ග **දෙකක්** ඒවායේ අර්ථයන් සමග සඳහන් කරන්න.

ඉජ්මාඋස් සරීහ් - පැහැදිලි ඉජ්මා
ඉජ්මාඋස් සුකූති - නිශ්ශබ්ද ඉජ්මා
ඉජ්මාඋල් අක්සරිය්යා - බහුතරයකගේ ඉජ්මා / බහුතරයකගේ තීරණය

WWW.OLEVELAPI.COM

**(වර්ග දෙක අර්ථය සමග ලියා ඇත්නම් ලකුණු 2යි.)**

(v) Zසකාත් ලැබීමට සුදුසු අය අතුරෙන් ෆකීර් සහ මිස්කීන් යන අය වෙන් කර දක්වන්න.

- ෆකීර් - කිසිදු ආදායමක් නොමැති අන්ත දුගියා
- මිස්කීන් - තමාට හා තමාගෙන් යැපෙන්නන්ට අවශ්‍ය පමණ ආදායමක් නොලබන්නා

**(ලකුණු 2යි.)**

(vi) 'සීරා' යන පදය මගින් අවබෝධ කරගන්නේ කුමක් ද?

මුහම්මද් නබි (සල්) තුමාගේ ජීවන චරිතය

**(ලකුණු 2යි.)**

(vii) 'අකීකා' සහ 'උල්හියා' යන්න අර්ථ දක්වන්න.

අකීකා - දරු උපතක් වෙනුවෙන් කුර්බාන් කර දන් දීම
උල්හියා - දුල් හජ් 10, 11, 12, 13 දින වල දෙනු ලබන කුර්බානය

**(මෙම කරුණු දෙක ලියා ඇත්නම් - 1 +1 = 2 යි.)**

(viii) "එක් කද්රයක සිට තවත් කද්රයක් දෙසට ගමන් කරමි" යනුවෙන් සඳහන් කළ සහාබි කවු ද?

උමර් (රලි) තුමා

**(ලකුණු 2යි.)**

(ix) මස්ජිදුන් නබවිහි විශේෂාංග **දෙකක්** සඳහන් කරන්න.

- වන්දනා ගමන යාම සඳහා අනුමැතිය ඇති පූජනීය ස්ථාන තුනෙන් එකකි.
- එහි ඉටු කරන එක් සලාත වේලක් සලාත් දහසකට සමාන වේ.

**(මෙවැනි කරුණු 2ක් ලියා ඇත්නම් ලකුණු 2යි.)**

(x) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ ඉස්ලාමික විනිශ්ච සඳහන් ග්‍රන්ථයේ නම සඳහන් කරන්න.

මුස්නද් අහ්මද්
කිතාබුල් මසාඉල් (ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල්)

**(කරුණු 2න් 1ක් ලියා ඇත්නම් ලකුණු 2යි.)**
**(මුළු ලකුණු 2 X 10 = 20)**

2. (i) 'මුඃජිසාතුල් කුර්ආන්' යනු කුමක් ද?

WWW.OLEVELAPI.COM

අල්කුර්ආනයේ ප්‍රාතිහාර්යයන් **(ලකුණු 2යි.)**

(ii) අල්-කුර්ආන් ප්‍රධාන මුස්ලිම් නීති මූලාශ්‍රයක් යන්න තහවුරු කිරීමට හේතු **තුනක්** සඳහන් කරන්න.

- අල්ලාහ් විසින් පහළ කරන ලද්දකි.
- නීතිය සෘජුව ලබා දෙයි.
- මුළු මිනිස් සංහතියටම මග පෙන්වන්නකි.
- කිසිදු වෙනසකට භාජනය නොවූවකි.
- අල්කුර්ආනය ආරක්ෂා කිරීමේ වගකීම අල්ලාහ් භාරගෙන ඇත.
- ජීවිතයේ සියලු අංශවලට මගපෙන්වීම

**(මෙවැනි කරුණු 3ක් ලියා ඇත්නම් ලකුණු 3යි.)**

(iii) අල්-කුර්ආන් ආරක්ෂා කිරීමට කලීෆා උස්මාන් (රලි) තුමාගේ දායකත්ව **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- ආර්මේනියාව, අසර්බයිජාන් ප්‍රදේශයේ ඉරාක හා ෂාම් (සිරියාව) වැසියන් විසින් අල්කුර්ආනය විවිධාකාරව පාරායනය කිරීම පිළිබඳව හුදෛෆතුල් යමානි (රලි) විසින් කලීෆා උස්මාන් (රලි) තුමාට පැමිණිලි කිරීමෙන් අනතුරුව අල් කුර්ආනය ආරක්ෂා කිරීමට පහත සඳහන් පියවර ගන්නා ලදි.
- අල්කුර්ආනයේ පිටපත් ලිවීම සඳහා සයිද් ඉබ්නු සාබිත් (රලි) තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම
- හෆ්සා (රලි) තුමිය සන්තකයේ තිබූ මුස්හෆ් පිටපත ලබාගෙන පිටපත් කිහිපයක් ලිවීම
- කුරෙෂ්වරුන්ගේ භාෂා ව්‍යවහාරය අනුගමනය කරමින් ලිවීම
- එය ඉස්ලාම් රාජ්‍යයේ පළාත්වලට කාරිවරු සමග යැවීම
- අනාගතයේදී අල්කුර්ආන් පාරායනය කිරීම පිළිබඳ ගැටුම් වැළැක්වීම සඳහා කලින් පැවති පිටපත් පුලුස්සා දැමීමට නියෝග කිරීම
- අල්කුර්ආනය පාරායනය කිරීම පිළිබඳ ඒකාකාරී බවක් ඇති කර මුස්ලිම්වරු එක්සත් කිරීම (ජාමිඋල් කුර්ආන්)

**(මෙවැනි කරුණු 5ක් කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5යි.)**

**(මුළු ලකුණු 2 + 3 + 5 = 10)**

3. (i) 'ඉබාදත්' යන්න අර්ථ දක්වන්න.

- නැමදීම, යටහත් වීම හා අවනත වීම මෙහි අර්ථය වේ.
- අල්ලාහ් අපට කළ විධාන අනුව ක්‍රියා කිරීම තුළින් හා වළක්වන ලද දෙයින් වැළකී සිටීම තුළින් ඔහුට යටහත්ව ක්‍රියා කිරීම වේ.
- අල්ලාහ් කෙරෙහි අසීමිත ආදරය සහිතව මුලුමනින්ම අවනත වීම

**(තේරුම පමණක් ඇත්නම් ලකුණු 01යි.)**

**(සම්පූර්ණ අර්ථ දැක්වීමට ලකුණු 2යි.)**

(ii) සලාතය අත්හරින්නාට නබි (සල්) තුමාගේ අවවාදාත්මකව කළ ප්‍රකාශ **තුනක්** සඳහන් කරන්න.

- යමෙක් හට සලාතය මග හැරෙන්නේද ඔහු තම පවුල, වස්තුව යනාදිය අහිමි වී සිටින්නෙකුට සමානය. (ඉබ්න් හිබ්බාන්)
- සලාතය අත්හැරීම කුෆ්රයට මග පාදයි.
- සලාතය අත්හරින්නා අල්ලාහ්ගේ කෝපයට ලක්වේ.
- පරමාන්ත දිනයේ මුළින්ම අසනු ලබන ඉබාදතයකි.
- ස්වර්ගය අහිමි වේ.
- ඔහු කාරූන්, හාමාන්, ෆිර්අවුන්, උබෛ ඉබ්නු කලෆ් යන අය සමග සිටින්නේය. (අහ්මද්)

WWW.OLEVELAPI.COM

**(මෙවැනි කරුණු 3ක් ලියා ඇත්නම් ලකුණු 3යි.)**

(iii) ෆර්ලු වූ උපවාසයට ඉස්ලාම් ලබාදී ඇති වැදගත්කම් **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- අනිවාර්ය වගකීම් අතර එකකි. (ෆර්ලු අයින්)
- දේව බිය (තක්වා) ඇති කරයි.
- පරලොවේදී ගැත්තා වෙනුවෙන් කන්නලව් කරයි.
- පව් සමාවද ඊට පිළියම් ද ලබාදෙයි.
- "සව්මය මා සතු වුවකි. එයට අදාළ ආනිශංස දෙනුයේ මාය" යනුවෙන් අල්ලාහ් පවසා තිබීම.
- අසීමිත වූ පින් ප්‍රමාණයක් ලබාදෙයි.
- ස්වර්ගයට විශේෂ දොරටුවකින් (රෙයාන්) පිවිසිය හැකිය.

**(මෙවැනි කරුණු 5ක් කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5යි.)**

**(මුළු ලකුණු 2 + 3 + 5 = 10)**

4. (i) සුහ්ද් සහ රහ්බානියා අතර වෙනස්කම් සඳහන් කරන්න.

Zසුහුද් - ඇල්මක් නොමැති මෙලොව ජීවිතය (ඉස්ලාම් අනුමත කරන අධ්‍යාත්මික ගුණාංගවලින් එකකි.)

රහ්බානියියා - පැවිදි තත්ත්වය (මෙලොව සැපසම්පත් සහමුලින් ම අත හැර දැමීම) ඉස්ලාම් හි මෙය තහනම් කර ඇත.

**(මෙම කරුණු දෙක අතර වෙනස ලියා ඇත්නම් ලකුණු 2ක් දෙන්න)**

(ii) තව්බා පිළිගැනීමට අවශ්‍ය කොන්දේසි **තුනක්** සඳහන් කරන්න.

- අල්ලාහ් වෙතය යන පිරිසිදු චේතනාවෙන් "තව්බා" කිරීම
- තමා කළ පාපයන් අතහැර එයින් සහමුලින් ම ඉවත් වීම
- තමා කළ පාපයන් සඳහා පසුතැවිලි වීම
- "පෙර කළ ඒ පාපය නැවතත් නොකරමි" යි ප්‍රතිඥා දීම
- කරන ලද පාපය මිනිසා හා සම්බන්ධ වන්නේ නම් ඔහුගෙන් සමාව ඉල්ලා පසුව අල්ලාහ්ගෙන් සමාව අයදීම

**(මෙයින් කරුණු 3ක් ලියා ඇත්නම් එක ලකුණ බැගින් ලකුණු 3යි.)**

(iii) ඉස්ලාම් උගන්වන යහපත් ගුණාංග **පහක්** සඳහන් කර ඒවා එකිනෙකට නබි (සල්) තුමාගේ ජීවිතයෙන් නිදසුන් දෙන්න.

- ඉවසීම
- කීකරු බව
- ආදරය
- දන්දීම
- ඉන්ද්‍රියන් රැක ගැනීම
- වීරත්වය/ ධෛර්යය
- සමාව දීම
- පරිත්‍යාගශීලි බව
- අවංක බව

WWW.OLEVELAPI.COM

**(මෙවැනි කරුණු 5කට ලකුණු 1/2 x 5 බැගින් ලකුණු 2 1/2ක් ද සුදුසු**
**(උදාහරණ පහකට 1/2 x 5 බැගින් ලකුණු 2 1/2 ද ලෙස ලකුණු 5යි)**
**(මුළු ලකුණු 2 + 3 + 5 = 10)**

5. (i) ඉස්ලාමීය මූලධර්ම ආරක්ෂා කර ගනිමින් ව්‍යාපාරයක යෙදීමේ දී මිලදී ගන්නන් සහ විකුණනන් ලබන පොදු වාසි **දෙකක්** සඳහන් කරන්න.

- දෙපාර්ශවය ම රැවටීමට ලක් නොවීම
- දෙපාර්ශවය ම සෑහීමට පත් වීම
- ඔවුන්ගේ ගනුදෙනු ක්‍රියාව නැමදුමක් බවට පත් වේ.
- දෙපාර්ශවය අතර සුහදතාවය පවත්වා ගැනීමට හැකිවේ.
- වෙළඳාමෙහි ස්ථාවරත්වයක් ඇති වෙයි.
- අනවශ්‍ය දෝෂාරෝපණවලින් ආරක්ෂාව ලැබේ.

**(මෙවැනි කරුණු 2ක් ලියා ඇත්නම් ලකුණු 2 යි)**

(ii) ඉස්ලාම් ආර්ථික ක්‍රමයේ විශේෂ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

- දේව ගුණාංග සහිත වීම
- න්‍යායශීලීභාවය
- හරාම් වලින් තොර වීම
- කිසි කෙනෙකුට අසාධාරණයක් සිදු නොවීම
- සමාජ යහපත හා පෞද්ගලික යහපත අතර සම්බන්ධතාවයක් ඇති කිරීම
- ආධ්‍යාත්මික අවශ්‍යතා හා ලෞකික අවශ්‍යතා ගැන සමව සැලකිල්ලට යොමු කිරීම
- සමාජය තුළ පැන නගින ආර්ථික උස් පහත්කම් තුලනය කිරීම

**(මෙවැනි කරුණු 3ක් කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 3 යි)**

(iii) ඉතිහාසයේ නබිවරුන් ලබා තිබූ රැකියා කුසලතාවන් **පහක්** පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

WWW.OLEVELAPI.COM

- නබි ආදම් (අලෛ) තුමා - බෝග වගාව හා සත්ත්ව පාලනය
- නබි ඉද්රීස් (අලෛ) තුමා - පේෂ කර්මාන්තය
- නබි Zසකරියා (අලෛ) තුමා - වඩු කර්මාන්තය
- නබි නුහ් (අලෛ) තුමා - වඩු කර්මාන්තය
- නබි දාවුද් (අලෛ) තුමා - ලෝහ කර්මාන්තය
- නබි මුහම්මද් (සල්) තුමා - සත්ත්ව පාලනය හා වෙළඳාම

**(නබිවරයෙකු නම් කර රැකියා කුසලතාව කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් 1 ලකුණක් බැගින් 1 x 5 = 5 යි.)**
**(පැහැදිලි කිරීම නොමැතිව නබිවරු 5 දෙනා නම් කර රැකියා කුසලතා පමණක් සඳහන් කර ඇත්නම් ලකුණු 03යි.)**
**(පැහැදිලි කිරීම නොමැතිව නබිවරු 3/4 දෙනෙක් නම් කර රැකියා කුසලතා පමණක් සඳහන් කර ඇත්නම් ලකුණු 02යි.)**
**(පැහැදිලි කිරීම නොමැතිව නබිවරු දෙදෙනෙකු නම් කර රැකියා කුසලතා පමණක් සඳහන් කර ඇත්නම් ලකුණු 01යි.)**

**(මුළු ලකුණු 2 + 3 + 5 = 10)**

6. (i) ඉස්ලාම් දෘෂ්ටිකෝණයට අනුව විවාහයේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

**(i)**
- සාලිහ් වූ පරම්පරාව බිහි කිරීම
- කායික හා මානසික ශාන්තිය ඇති කිරීම
- හොඳ සමාජ ක්‍රමය ඇති කිරීම
- පතිවත රැකගැනීම
- පාපකර්ම වලින් මිදී ආරක්ෂා වීම

**(මෙවැනි කරුණු 2 ක් සඳහන් කර ඇත්නම් ලකුණු 2 යි)**

(ii) තාරුණ්‍යය ඵලදායි ලෙස වෙනස් කිරීමට ඉස්ලාම් සඳහන් කරන මගපෙන්වීම් **තුනක්** සඳහන් කරන්න.

- ආධ්‍යාත්මික කටයුතුවල නිරත වීම (දික්ර්, සලවාත්, තව්බා යනාදිය)
- යහපත් අය සමග ඇසුරු කිරීම
- අල්කුර්ආන් හා සුන්නාහ් වල උපදෙස් පිළිපැදීම
- හොඳ පොත්පත් කියවීම/ ආගමික දේශනාවලට සවන් දීම
- මත් ද්‍රව්‍ය භාවිතයෙන් සහමුළින්ම වැළකීම
- පරමාදර්ශී හා ධනාත්මක සිතුවිලි සහිත වීම
- පෝෂ්‍යදායී ආහාර ගැනීම හා ශාරීරික ව්‍යායාමවල යෙදීම
- ජනමාධ්‍ය විධිමත් ලෙස පරිහරණය කිරීම
- අජ්නබි - මහ්රම් සීමාව රැක ගැනීම

**(මෙවැනි කරුණු 3කට ලකුණු 3 යි)**

(iii) ජීවිතයේ මධ්‍යස්ථභාවය (වසතියියා) සුරැකීම පිළිබඳ ඉස්ලාම් ඉදිරිපත් කර ඇති ක්‍රමවේද **පහක්** පැහැදිලි කරන්න.

- වියදම් කිරීමේදී නාස්තියෙන් හා මසුරුකමින් තොර වීම
- ආධ්‍යාත්මික කටයුතුවල දැඩි මත දැරීමෙන් වැළකී සිටීම
- මෙලොව ජීවිතය හා පරලොව ජීවිතය අතර සමබරතාවය පවත්වා ගැනීම
- හුකූකුල්ලාහ් හා හුකූකුල් ඉබාද්වල සමබරතාවය රැකීම
- ආහාර, ඇඳුම් පැළඳුම් හා හැසිරීම් රටාවල මධ්‍යස්ථභාවය රැකීම
- මධ්‍යස්ථභාවය යනු දැඩි මත දැරීම හෝ නොසලකා හැරීම හෝ නොවන බව වටහා ගෙන ක්‍රියා කිරීම

**(මෙවැනි කරුණු 5ක් පැහැදිලි කර තිබේ නම් ලකුණු 5යි)**

**(මුළු ලකුණු 2 + 3 + 5 = 10)**

WWW.OLEVELAPI.COM

7. පහත මාතෘකාවලින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පූර්වාදර්ශ වූ ඉස්ලාම් පවුලක ලක්ෂණ

- පූර්වාදර්ශ පවුල සැනසීම, සතුට, ශාන්තිය ගෙන දෙයි.
- ස්වර්ගය අරමුණු කොට කටයුතු කිරීම
- පවුලේ සෑම සාමාජිකයකුම තම වගකීම් හා යුතුකම් නිසි ආකාරයට ඉටු කිරීම
- සැමියා ආගමික බැතිමතෙකු ලෙස දැහැමි ජීවිතයට මග පෙන්වන්නෙකු වීම
- බිරිඳ දේව තෘප්තිය අරමුණු කොට නිතරම ස්වාමියාට යටත් වී ඔහුව තෘප්තිමත් කිරීම
- අසල්වැසියන් සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම
- පවුලේ සාමාජිකයින් තම පවුලට කිසිදු අපකීර්තියක් නොවන ආකාරයට කටයුතු කිරීම
- ලේ නෑකම් පවත්වාගැනීම

**(මෙවැනි කරුණු 5ක් පැහැදිලි කර ඇත්නම් ලකුණු (1 x 5) 5 යි)**

(ii) කලීෆා ලෙස උමර් (රලි) තුමාගේ සේවාවන්

- රෝමයේ හා පර්සියාවේ දැඩි පාලනයට ලක් වූ ජනතාව මුදවා ගැනීම
- ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ආණ්ඩුකාරවරුන් ලෙස පත් කර පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම
- නීති අංශය ස්වාධීනව ක්‍රියාත්මක කිරීම
- ප්‍රාදේශීය මට්ටමෙන් පරිපාලන ඒකක පිහිටුවීම
- බයිතුල්මාල් ස්ථාපිත කිරීම
- සංවිධානාත්මක විධිමත් හමුදාවක් ඇති කිරීම
- නගර නිර්මාණ, සෞඛ්‍ය සේවා, වාරි මාර්ග පහසුකම් ආදිය ඇති කිරීම
- හිජ්රි දින දර්ශනය හඳුන්වා දීම
- ඉස්ලාම් ඉතිහාසයේ ප්‍රථම වරට අනන්‍ය වූ කාසි නිකුත් කිරීම

**(මෙවැනි කරුණු 5ක් පැහැදිලි කර ඇත්නම් ලකුණු (1 x 5) 5 යි)**

WWW.OLEVELAPI.COM

(iii) ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දුන් ඉතිහාසය

- අරාබි වෙළඳුන්ගේ පැමිණීමත් සමග ඉස්ලාමය ශ්‍රී ලංකාවට හඳුන්වා දීම
- වහබ් ඉබ්නු අබී හෆ්සා (රලි) තුමාගේ පැමිණීම හා සම්බන්ධ සිද්ධිය
- උමර් (රලි) තුමාගේ කාලයේ ඉස්ලාමය හඳුන්වා දුන් බවට ඉබ්නු සහරයාර්ගේ සටහන්
- හජ්ජාජ් බින් යුසුෆ්ගේ හිරිහැර නිසා බනූ හාෂිම්වරු ලංකා මුහුදු තීරයේ පදිංචි වීම පිළිබඳ සර් ජේම්ස් එමසන්ක්ට් ටෙනන්ට්ගේ 'සිලෝන්' කෘතියේ සටහන
- අරාබි වෙළෙඳුන් කිහිප දෙනෙකුගේ වැන්දඹුවන් හා අනාථ දරුවන් යවන ලද නැව තේබල් වරායේදී කොල්ලකරුවන් විසින් අත්පත් කරගැනීම සහ හජ්ජාජ්ගේ කටයුතු පිළිබඳ සිද්ධිය (අල් බලාදූරි)
- කාලිද් ඉබ්නු බකායා තුමාගේ පැමිණීම

**(මෙවැනි කරුණු 5ක් පැහැදිලි කර ඇත්නම් ලකුණු (1 x 5) 5 යි)**

(iv) නබි (සල්) තුමා මක්කා සමයේ ඉස්ලාම් දහමට ආරාධනා කරමින් ඉටුකළ සේවාව

- සූරතුල් මුද්දසිර් හි පළමු වාක්‍ය කිහිපයක් (7ක්) පහළ වීමෙන් අනතුරුව නබි (සල්) තුමාණන් තම ප්‍රචාරණ කටයුතු ආරම්භ කිරීම
- ප්‍රථමයෙන් ම තම පවුලේ අයටත්, යහළුවන්ටත් ප්‍රචාරය කිරීම
- පළමු වසර තුන තුළ "දාරුල් අර්කම්" හි රහසිගත ප්‍රචාරය සිදු කිරීම
- ඉස්ලාමීය මූලික විශ්වාස හා යහපත් ගුණ දහම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
- ප්‍රසිද්ධ ප්‍රචාරය සෆා කන්ද මුදුනේ සිට සිදු කිරීම
- ඒ සමග කුරෙයිෂිවරුන්ගේ හිරිහැර, තර්ජන සහ අභියෝගවලට ඉවසීමෙන් මුහුණදීම
- අභියෝගවලට ඉවසීමෙන් මුහුණදීම
- නුබුව්වත් 05 සහ 07 වසරවල අබිසීනියාවට හිජ්රත් යාම
- පළමුවන හා දෙවන අකබා ගිවිසුම් ඇතිකර ගැනීම

**(මෙවැනි කරුණු 5ක් පැහැදිලි කර ඇත්නම් ලකුණු (1 x 5) 5 ක් දෙන්න)**

**(මුළු ලකුණු 5 + 5 = 10)**

WWW.OLEVELAPI.COM